# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1727/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 19/11/2024<br>පැය 0600 |

# මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් සිදුකර සැකකරු ගෙල වැලලාගෙන මියයාම - මොරගොඩ පොලිස් වසම.**

2024.11.18 වන දින උදෑසන කාලයේ මොරවැව පොලිස් වසමේ වන්නම්කුලම් ප්‍රදේශයේදී කාන්තාවකට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර තවත් කාන්තාවකට බරපතල තුවාල සිදු කර සැකකරු ඔහුගේ නිවසට ගොස් ගෙල වැලලාගෙන මියගොස් ඇති බවට ලද පණිවිඩයක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 35 ක් වන අතර, මරණකරු වයස අවුරුදු 30 ක් වන වන්නම්කුලම්, ලබුනෝරුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මරණකාරිය හා සැකකරු අතර පැවති අනියම් සම්බන්ධතාවයක් මත මෙම ඝාතනය සිදුව ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීර සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණ සිදු කර අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තුවාලකාරිය අනුරාධපුර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී. මොරගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - ඇල්පිටිය පොලිස් වසම.**

2024.11.18 වන දින රාත්‍රී කාලයේ ඇල්පිටිය පොලිස් වසමේ නවදගල ප්‍රදේශයේදී වෙළඳසැලකට පැමිණි පුද්ගලයෙකු එහි හිමිකරුට තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් තුවාල ලබා ඇල්පිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇති බවට ලද පණිවිඩයක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් වන ඉහල නවදගල, ඇල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බීමත්ව වෙළඳසැලට පැමිණි පුද්ගලයෙකු විසින් මෙම ඝාතනය සිදුකර ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර, සැකකරුද තුවාල ලබා ඇල්පිටිය රෝහලට ඇතුලත් කර ඇත. සැකකරු වයස අවුරුදු 34 ක් වන නවදගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කරන සැකකරුවන් දෙදෙනෙකු විදේශ රටක නිෂ්පාදිත රිවෝල්වර් අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.09.20 වන දින දෙහිවල පොලිස් වසමේ නැදිමාල ප්‍රදේශයේදී යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු විසින් කළුබෝවිල, දෙහිවල ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධව බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශන සිදුකර මෙම ඝාතනය සම්බන්ධ සැකකරුවෙකු 2024.11.18 වන දින සවස් කාලයේ හෝමාගම පොලිස් වසමේ පනාගොඩ ප්‍රදේශයේදී යතුරු පැදියකින් ගමන් කරමින් සිටියදී අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු සන්තකයේ තිබූ ගමන් මල්ලක තිබී මෙම ඝාතනය යොදා ගත් බවට සැකකරන **විදේශ රටක නිෂ්පාදිත රිවෝල්වර් වර්ගයේ අවියක් සහ එම පතරොම් 06 ක්** පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන හඳපාන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදු කරන ලද ප්‍රශ්න කිරීමේදී අනාවරණය වූ තොරතුරු මත මෙම ඝාතනයට සැකකරු සමඟ යතුරු පැදියෙන් පැමිණි පැදිකරු අතුරුගිරිය පොලිස් වසමේ මොරටුවාහේන පාර ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 30 ක් වන අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුවන්ගේ තොරතුරු මත වෙඩි තැබීමට පැමිණි යතුරු පැදිය කොටස් කර පාදුක්ක පොලිස් වසමේ සඟවා තිබියදී සොයා ගෙන ඇත. වෙඩි තැබීම කරන

ලද අවස්ථාවේ පැළඳ සිටි හිස් වැසුම් දෙකත් දෙවන සැකකරුගේ නිවසේ තිබියදී සොයා ගෙන ඇත.

විදේශ රටක සිටින සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ මෙහෙයවීම මත මෙම ඝාතනය සිදුකර ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. ගව ඝාතකාගාරයක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.11.18 වන දින උදෑසන කාලයේ බණ්ඩාරගම පොලිස් වසමේ අටළුගම ප්‍රදේශයේදී බලපත්‍ර නොමැතිව ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යන බවට පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගව මස් කිලෝ 39 ග්‍රෑම් 950 ක්, මී ගව පැටවුන් 02ක්, මන්නා පිහි 02 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බණ්ඩාරගම පොලිසිය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වූ බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බණ්ඩාරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පානදුර උතුර පොලිස් ස්ථානය.

2024.11.18 වන දින අළුයම් කාලයේ පානදුර උතුර පොලිස් වසමේ කදුරුදූව තිලක පාර හන්දියේදී පානදුර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 21 මිලිග්‍රෑම් 270 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පානදුර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.11.18 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ෆර්ගියුෂන් පාර ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.

2024.11.18 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ නාදගමුව වැව හන්දියේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය.

2024.11.18 වන දින සවස් කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ තොරණ හන්දියේදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 වන කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.11.18 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.11.18 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 320** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අලවතුගොඩ පොලිස් ස්ථානය.**

2024.11.18 වන දින සවස් කාලයේ අලවතුගොඩ පොලිස් වසමේ දුනුවිල ප්‍රදේශයේදී අලවතුගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ අවියක් සහ එම පතරොම් 06 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 70 ක් වන අකුරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අලවතුගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පූනෑව පොලිස් ස්ථානය.**

2024.11.18 වන දින සවස් කාලයේ පූනෑව පොලිස් වසමේ පෙරියකුලම් ප්‍රදේශයේදී පූනෑව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන මැදවච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පූනෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මහව පොලිස් ස්ථානය.**

2024.11.18 වන දින සවස් කාලයේ මහව පොලිස් වසමේ පහල නෙත්තිපලගම ප්‍රදේශයේදී මහව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන කහටගස්දිගිලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර කොට්ඨාස දූෂණ මර්දන අංශය.**

2024.11.18 වන දින දහවල් කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ දෙල්ගස්මූකලාන ප්‍රදේශයේදී කළුතර කොට්ඨාස දූෂණ මර්දන අංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 67.5 ක් සහ නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 538 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බුලත්සිංහල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 වන බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**15. ගංජා හේන් 02 ක් වටලා සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බුත්තල පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.11.18 වන දින උදෑසන කාලයේ ගෝනගංආර පොලිස් වසමේ යාල රක්ෂිතයේ සුහන්දිරම්ආර ප්‍රදේශයේදී බුත්තල පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අක්කරයක සහ අක්කර 02 ක පමණ භූමි ප්‍රමාණයකින් යුත් ගංජා හේන් 02 ක් වටලා සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ගෝනගංආර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30, 32 හා 47 වයස්වල පසුවන තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**16. යතුරු පැදි සොරකමක් සහ වෙළඳ සැලක් බිඳ දේපල සොරකම් කළ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

පාදුක්ක පොලිස් වසමේ සිදුකළ යතුරු පැදි සොරකමක් සහ මාලබේ පොලිස් වසමේ සිදුකළ වෙළඳ සැලක් බිඳ දේපල සොරකම් කිරීමේ අපරාධයන්ට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු 2024.11.18 වන දින අතුරුගිරිය පොලිස් වසමේ මාලසිංහගොඩ පාර ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 වන හෝකන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදු කරන ලද ප්‍රශ්න කිරීමේදී සොරකම් කරන ලද යතුරු පැදිය සහ බෆල් යන්ත්‍රයක් සොයා ගෙන ඇත. සැකකරුට කඩුවෙල ගරු මහේස්ත්‍රාත් අධිකරණය මගින් වරෙන්තුවක්ද නිකුර කර ඇත. අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**17. වීසා නොමැතිව මෙරට රැඳී සිටි විදේශිකයන් 08 දෙනෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.**

2024.11.18 වන දින සවස් කාලයේදී කටුනායක පොලිස් වසමේ ආඩිඅම්බලම ප්‍රදේශයේ සංචාරක හෝටලක වීසා නොමැතිව පිරිසක් රැඳී සිටින බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් ලැබී ඇත. ඒ අනුව කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර ආගමන විගමන කොන්දේසි උල්ලංගණය කරමින් වීසා නොමැතිව රැඳී සිටි විදේශිකයන් 08 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20 ත් 30 ත් අතර වයස්වල පසුවන බංගලාදේශ ජාතිකයන් වේ.**

කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 18. බඳින කඳක් පත්තුවී පුද්ගලයෙකු තුවාලවීම - දඹගල්ල පොලිස් වසම.

2024.11.18 වන දින රාත්‍රී කාලයේදී දඹගල්ල පොලිස් වසමේ දෙහිවැල්ලන්ද ප්‍රදේශයේදී බඳින කඳක් පත්තුවී පුද්ගලයෙකු තුවාල ලබා මොරණරාගල සිරිගල රෝහලට ඇතුලත් කර ඇති බවට දඹගල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 48 ක් වූ දොඹගහවෙල, දඹගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරු නිවස ආසන්නයේ පිහිට ලඳු කැලෑවේ ගමන් කිරීමේදී මෙම අනතුරට ලක්ව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. දඹගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 19. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - පරයනාලන්කුලම් පොලිස් වසම.

2024.11.18 වන දින දහවල් කාලයේදී පරයනාලන්කුලම් පොලිස් වසමේ ආඬියාපුලියන්කුලම් ප්‍රදේශයේදී විදුලි සැර වැදී පුද්ගලයෙකු සෙට්ටිකුලම් රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට පරයනාලන්කුලම් පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වූ පුදුකුලම, ආඬියාපුලියන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විසින් නිවසේදී රෙදි මැදීමට යාමේදී විදුලි ස්ත්‍රික්කයෙන් විදුලි සැර වැදී ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පරයනාලන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 20. අකුණු සැර වැදී පුද්ගලයෙකු මියයාම - ඇල්පිටිය පොලිස් වසම.

2024.11.18 වන දින සවස් කාලයේදී ඇල්පිටිය පොලිස් වසමේ මද්දේවිල ප්‍රදේශයේදී පුද්ගලයෙකු අකුණු සැර වැදී ඇල්පිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට ඇල්පිටිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ මද්දේවිල, ඇත්කඳුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කුරුඳු වාඩියක කුරුඳු තලමින් සිටියදී මෙම අනතුරට මුහුණපා ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 21. දුම්රියේ පාපුවරුවේ ගමන්කළ පුද්ගලයෙකු සංඥා කණුවක ගැටී මියයාම - කිරිබත්ගොඩ පොලිස් වසම.

2024.11.18 වන දින උදෑසන කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ පොල්ගහවෙල සිට කොළඹ කොටුව බලා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියක පාපුවරුවේ ගමන්කළ පුද්ගලයෙකු දුම්රිය මාර්ගය අයිනේ තිබූ සංඥා කණුවක ගැටී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ දෙනිය පාර, ගණේමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිරිබත්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 22. මාරක රිය අනතුරක් - ඇතිමලේ පොලිස් වසම.

2024.11.18 වන දින උදෑසන කාලයේ ඇතිමලේ පොලිස් වසමේ ඇතිමලේ කොටියාගල මාර්ගයේ අක්කර 100 ප්‍රදේශයේදී නිවසක සිට මාර්ගයට එක් වරම ඇතුල් කරන ලද යතුරු පැදියක් 05 කණුව දෙස සිට කොටියාගල දෙසට ධාවනය වූ යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරුවන් දෙදෙනා සහ පිටුපස ගමන්කළ දරුවෙකු බරපතල තුවාල ලබා ඇතිමලේ රෝහලට ඇතුලත් කිරීමේදී එක් යතුරු පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ අංක 80, කොටියාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇතිමලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 23. මාරක රිය අනතුරක් - කින්නියා පොලිස් වසම.

2024.11.18 වන දින සවස් කාලයේ කින්නියා පොලිස් වසමේ මඩකලපුව ත්‍රිකුණාමලය මාර්ගයේ උප්පාරු සුසාන භූමිය අසලදී මඩකලපුව දෙස සිට ත්‍රිකුණාමලය දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය අයිනේ ගමන්කළ පදික පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු සහ පදිකයා බරපතල තුවාල ලබා කින්නියා රෝහලට ඇතුලත් කිරීමේදී පදිකයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වූ පයිසල් නගර්, කින්නියා ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ත්‍රිකුණාමලය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තුවාලකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා ත්‍රිකුණාමලය රෝහල වෙත මාරු කර යවා ඇත. කින්නියා පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**